ඇමුණුම 01

# "සුවපහසු" මූල්‍යාධාර වැඩසටහන - 2025

## 01. හැඳින්වීම

ජීවත් වීමට අවශ්‍ය වන මූලික පහසුකම් පවා අහිමිව මහත් පීඩාවට ලක් වෙමින් තම ජීවිතයේ සැඳෑ සමය ගත කරන වැඩිහිටි පිරිසක් අප සමාජයේ ජීවත් වෙති. මෙවැනි වැඩිහිටි ප්‍රජාවට අස්වැසිල්ලක් වෙමින්, ඔවුනගේ අවම පහසුකම් සලසා දීමට පියවර ගැනීම මෙම වැඩසටහන මගින් සිදු කරනු ලබයි. මෙම වැඩසටහන "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවෙහි 02.6හි සඳහන් " නිවෙස් තුළ වැඩිහිටියන් රැකබලා ගැනීමේ කටයුතු කරන අවස්ථා වල මූලික පහසුකම් සැපයීම" යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ.

වැඩිහිටියාට උපරිම රු100,000.00කට යටත්ව පහත සඳහන් අවශ්‍යතා සඳහා මෙම ආධාර මුදල් භාවිතා කළ හැක.

- වැඩිහිටියාට අවශ්‍ය පරිදි වැසිකිළි පහසුකම් සලසා දීම. ( කොමඩ් සවි කිරීම/ වැසිකිළි ඉදි කිරීම)
- ප්‍රතිලාභියා ජීවත්වන නිවසෙහි වැඩිහිටියා සඳහා වෙන් වූ කොටස වැඩිහිටියාට ජීවත්වීමට අවශ්‍ය අවම පහසුකම් සහිත වන පරිදි අලුත්වැඩියා කිරීම සඳහා
- නිවස තුළ වැඩිහිටියාගේ ප්‍රවේශ පහසුකම් ඉහළ දැමීම වෙනුවෙන් අත් වැටවල් (Railing / Ramps) හා ප්‍රවේශ මාර්ග යනාදිය සකස් කිරීම.
- වෙනත් සුදුසු උපකරණ (අත්වාරු, වෝකර්, රෝද පුටු හා කොමඩ් සහිත රෝද පුටු, වායු මෙට්ට, ජල මෙට්ට, සනීපාරක්ෂක ද්‍රව්‍ය(පැම්පස්)) ඇඳක්, පුටුවක්, ඇඳ ඇතිරිලි (උපරිම 02 ක්), මදුරු දැලක්, කොට්ටයක්, මෙට්ටයක්)

## 02. අරමුණු

- වැඩිහිටියන්ට තම නිවාස තුළ ජීවත්වීම සඳහා අවශ්‍යවන අවම පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම් සපයාදීම.
- වැඩිහිටියන්ගේ සුබ සාධනය හා සෞඛ්‍ය තත්තවය ඉහළ නැංවීම සඳහා දායක වීම.
- පවුල් ඒකකය තුළ වැඩිහිටියා සුරක්ෂිත කිරීම.

## 03. ක්‍රියාත්මක ක්‍රමවේදය

1. අදාළ අයදුම්පත් ග්‍රාම නිලධාරී විසින්, පදිංචිය හා අඩු ආදායම්ලාභී බව සනාථ කළයුතු අතර, වැඩිහිටි විෂය සම්බන්ධ නිලධාරී විසින් ආධාර මුදල ලබාදීම සුදුසු බව සහතික කළයුතුය. එසේ ඉල්ලීම් ඉදිරිපත් කළ නොහැකි වැඩිහිටියන් සඳහා භාරකරුවෙකු මගින් අයඳුම්පත ඉදිරිපත් කළ හැකිය.

2. ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන ඉල්ලීම් අතුරින් අවශ්‍යතාවයේ ප්‍රමුඛතාව මත අදාළ ප්‍රතිලාභීන් තෝරා ගැනීම, සාමාජිකයින් තිදෙනෙකුගෙන් (03) යුත් කමිටුවක් මගින් සිදු කළ යුතුය.

3. මෙම කමිටුව, සහකාර ප්‍රාදේශිය ලේකම්/ සහකාර ප්‍රාදේශිය (සැලසුම්) සභාපතිත්වයෙන් ද, වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි/ සංවර්ධන නිලධාරි (වැඩිහිටි)/සමාජ සේවා නිලධාරි/සංවර්ධන නිලධාරි (සමාජ සේවා) යන අයගෙන් එක් නිලධාරියෙකු හා පරිපාලන ග්‍රාම නිලධාරි/ වෙනත් සුදුසු නිලධාරියෙකුගේ සාමාජිකත්වයෙන් සකස් විය යුතුය.

4. මෙම ආධාරය එක් ප්‍රතිලාභියෙකු සඳහා එක් වතාවක් පමණක් ලබාදෙන බැවින්, ප්‍රතිලාභියාගේ සැබෑ අවශ්‍යතාවය හඳුනාගෙන ප්‍රතිලාභියෙකු වෙත හිමිවන උපරිම මුදල් සීමාව යටතේ එම මුදලට ප්‍රමාණවත් අවශ්‍යතා ඇති ප්‍රතිලාභීන් සඳහා ප්‍රමුඛතාව ලැබෙන පරිදි ප්‍රතිලාභීන් තෝරා ගැනීම.

5. ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී, තනිව වෙසෙන හා රෝගාතුර වැඩිහිටියන් වෙසෙන අඩු පහසුකම් සහිත ගෘහ ඒකක, සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

6. මේ යටතේ, එම නිවස වැඩිහිටියාට හෝ භාරකරුවෙකුට අයිතියක් නොවන අවස්ථාවක ද්‍රව්‍යමය ආධාර පමණක් ලබා දීම සිදුකළ යුතුය. අදාළ ප්‍රතිලාභියා කුලී පදනම මත නේවාසිකව සිටීනම් මෙම ආධාර ඉදි කිරීම් සඳහා භාවිතා කළ නොහැක.

7. ඉල්ලුම්කරු, තමාගේ නොවන ස්ථානයක දරුවකු /ඥාතියෙකු සමඟ ජීවත් වේ නම්, එවැනි විටෙක අදාළ ඉල්ලුම්කරු වෙනුවෙන් ඉදිකිරීම් සිදු කිරීමට නිවසේ හිමිකරුගේ එකඟතාව ලබා ගත යුතු අතර, ඔහු/ඇය මිය යන තෙක් රැකබලා ගන්නා බවට දිවුරුම් ප්‍රකාශයක් ලබා ගත යුතුය.

8. දළ ඇස්තමේන්තු සකස් කිරීමේදී වෙළඳ පොළ පවතින මිල ගණන් සලකා බලා එකම භාණ්ඩය මිලදී ගැනීමේදී අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලට පොදු මිලක් යටතේ සකස් කල යුතු අතර, ආධාර මුදල් ලැබුණු පසු ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව මිලදී ගැනීම සිදුකල යුතුය.

9. ඉහත කමිටුව විසින් තෝරාගන්නා ලද ප්‍රතිලාභීන්ගේ අයදුම්පත්‍ර ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොනුගත කල යුතුය.

10. මේ සඳහා වන ඉල්ලීම් ඉදිරිපත් කිරීමේදී මේ සමඟ ඇති ඇමුණුම 02 ආකෘතිය මඟින් පමණක් ඉදිරිපත් කළ යුතු අතර, අදාළ අයදුම්පත්‍ර මෙම කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

11. 2025 වර්ෂයට අදාළ ඉල්ලීම් 2025.08.31 දිනට පෙර යොමුකළ යුතුය.

12. එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සඳහා වෙන් කරන ලද මුදල් ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව අනුව ලබාදෙන අතර, උපරිම මුදල් සීමාව පහත පරිදි වේ.

| | |
|---|---|
| **ග්‍රාම නිලධාරි වසම් 1 සිට 20** | **= රු. 700,000.00** |
| **ග්‍රාම නිලධාරි වසම් 21 සිට 40** | **= රු. 900,000.00** |
| **ග්‍රාම නිලධාරි වසම් 41 සිට 60** | **= රු. 1,100,000.00** |
| **ග්‍රාම නිලධාරි වසම් 61 සිට 80** | **= රු. 1,300,000.00** |
| **ග්‍රාම නිලධාරි වසම් 80ට වැඩි** | **= රු. 1,500,000.00** |

13. මෙම ආධාරය ***එක් වැඩිහිටියෙකු වෙනුවෙන් රු.100,000.00ක*** උපරිම සීමාවකට යටත්ව ප්‍රතිලාභ ලබා දෙනු අතර, ඉදිකිරීම් යටතේ ලබා දෙනු ලබන ආධාර සඳහා රු.100,000.00ක මුදල් සීමාව ඉක්මවා යන්නේ නම්, එම මුදල් සපයා ගන්නා ආකාරය පිළිබඳව දැනුවත් කළ යුතුය.

14. මෙම ආධාරය ප්‍රතිලාභියා වෙත මුදල් වශයෙන් ලබාදිය නොහැකි අතර, ඊට සරිලන භාණ්ඩ හෝ ද්‍රව්‍ය ලබාදිය යුතුය. තවද, ඉදි කිරීමක් සිදු කරන්නේ නම් නියමිත ක්‍රමවේදයට අනුව එම ඉදි කිරීම සිදු කර දිය යුතුය.

15. මෙහිදී අවස්ථානුකූලව ප්‍රවාහනය සඳහා හා වැඩ කුලිය සඳහා මුදල් අවශ්‍ය අවස්ථා වලදී එම මුදල ඇස්තමේන්තුවට ඇතුලත් කිරීමේ හැකියාව ඇති අතර, එම කාර්යය විනිවිදභාවය ආරක්ෂා වන පරිදි ප්‍රාදේශීය ලේකම්ගේ උපදෙස් යටතේ සිදු කළ යුතුය.

16. ආධාර ලබාදෙන ලද ප්‍රතිලාභියෙකු මියගිය පසු එම වැඩිහිටියා හට ලබාදෙන ලද භාණ්ඩ නැවත භාවිතා කළ හැකි මට්ටමේ පවතී නම් එම භාණ්ඩ නැවතත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා ගැනීමට පියවර ගත යුතුය.

17. මේ යටතේ අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යොමුකරනු ලබන ආධාර මුදල්, ආධාර හිමි ප්‍රතිලාභීන් වෙත කඩිනමින් ලබාදීමට කටයුතු කළ යුතු අතර, මේ යටතේ ලබාදෙන මුදල් අදාළ ලිත් වර්ෂය තුළම වියදම් කළ යුතුය.

18. මෙම වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදෙනු ලබන මුදල්, නියමිත ක්‍රමවේදය අනුව, අදාළ ප්‍රතිලාභීන් වෙත ලබාදිය හැකි උපරිම ප්‍රතිලාභ ලබාදිය යුතුය. යම් හේතුවකින් ප්‍රතිලාභියෙකු වෙත ආධාර ලබාදීමට නොහැකි වන්නේ නම්, (මියයාම, පදිංචිය හැර යාම හෝ වෙනත් නොවැලැක්විය හැකි හේතුවක් මත) එම මුදල, ප්‍රමුඛතා ලේඛනයේ ඊළග ඉල්ලුම්කරු වෙත ලබාදීමට හැකියාව ඇති අතර, ඒ අනුව ආධාර ලබාදෙන ලද නව ප්‍රතිලාභියාගේ තොරතුරු සම්බන්ධයෙන් මෙම කාර්යාලයේ අධ්‍යක්ෂකගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

19. එමෙන්ම ආධාර වෙනුවෙන් යවන ලද මුදලක් නැවත එවන්නේ නම්, ***අධ්‍යක්ෂ, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය (Director, National Secretariat for Elders)*** නමින් ලියන ලද චෙක්පතක් මගින් යොමු කිරීමට හෝ අදාළ ගිණුමට තැන්පත් කිරීමට හැකියාව ඇත.

**05. පසු විපරම් කටයුතු සිදු කිරීම**

i. ප්‍රාදේශීය ලේකම්ගේ උපදෙස් පරිදි මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය, මෙහෙයවීම, අධීක්ෂණය හා ප්‍රගතිය ඉදිරිපත් කිරීම ඇතුළු පසුවිපරම් කටයුතු අදාළ කොට්ඨාසයේ වැඩිහිටි විෂය භාර ක්ෂේත්‍ර නිලධාරි මඟින් සිදු කළ යුතුය.

ii. ආධාර මුදල් ලබාදී මාස 3ක් ඇතුළත අදාළ කාර්ය අවසන් කර විෂය නිලධාරි විසින් අවසන් වාර්තාව සකස් කර ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සහිතව ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත යොමු කළ යුතුය.

iii. ඉදිකිරීම් සම්බන්ධ වැඩ අවසන් වාර්තාව, ඡායාරූප සහිතව ඉදිරිපත් කළ යුතුය.

කේ. චතුර මිහිදුම්<br>
අධ්‍යක්ෂ<br>
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය